මහනුවර රජ පරපුරට සෙවන දුන් රජ මාලිගය - අද

මහනුවර රාජධානියේ රජ මාලිගය සහ අවසාන රජ පෙළපත

සටහන සහ සේයාරූ-ලාල් ජයසුන්දර

ශ්‍රී ලංකාවේ අවසාන රජු හෙවත් වඩාත රජා යැයි ජනතාවගේ දැඩි අප්‍රසාදයට ලක්වූ රජෙකු ලෙස ප්‍රචලිත ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සම්බන්ධයෙන් ඇසෙන පුවත් සමඟ, මේ එකී රසබර අතීතයක මතක සටහන් අවදි කිරීමකි. එදා රජ මාලිග සංකීර්ණය ගොඩනැගිලි 18කින් පමණ සමන්විත වන්නට ඇතැයි පැවසේ. එහෙත් ඉංග්‍රීසීන් විසින් ගිනි තබා විනාශ කළ නිසා එයින් යම් ප්‍රමාණයක් විනාශ වී ඇත. රජමැදුර, මැදුවාසල, පල්ලෙවාසල, මඟුල් මඩුව, ජයතිලක මණ්ඩපය, උළුපැන්ගේ සහ දළදා මැදුර පැරණි සහ නව මාලිග සංකීර්ණය දළදා මැදුරු සංකීර්ණය තුළ දැකිය හැකි සුවිශේෂී ස්ථාන අතර වැදගත් තැනක් ගනියි.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජ මැදුර දිග අඩි 140ක් පමණ වන අතර, පළල අඩි 50ක් පමණ වෙයි. මාලිගය අහසක්පස දිග අතට ද්විත්ව ආලින්ද්‍යයකි. මාලිගයේ විහාර කාමර තුනක් සහ කුඩා කාමර තුනක් තිබන්නට ඇතැයි පුරාවිද්‍යාත්මු අනුමාන කරති. ඉදිරිපස දෙරටුව ප්‍රමාණයෙන් අඩි 8ක් පමණ විශාලය. මාලිගයට ඉහළ මාලයක් තිබූ බවට අනුමාන කරන සාක්ෂියක් ලෙස විද්වත්තු පෙන්වා දෙන්නේ අඳවන් එකී ඉතිරිව ඇති පියගැට දෙකයි.

විහල පෙති උළුවළුන් සැකසී ඇත. රජවරුන්ට විදේශීය බලඵලවල අවස්ථාවන්හිදී මාලිගයටද ප්‍රසාද එළිපලු බවට ඉතිහාසඥයෝ පවසති. වර්තමාන නවීකරණයට ලක්වීම නිසා මුල් අවස්ථාවන් දැකගත නොහැක. ඒ අතර රජ මාලිගාවේ අද දක්නට ඇති වහල 1765 මිලන්දු සම්ප්‍රදාය අනුව ප්‍රතිසංස්කරණය කරන්නට ඇතැයි මතයකි.

මාලිගයේ ආරක්ෂාව සඳහා මාලිගය වටා පවුර, දිය අගල සහ ඔය අගලක් විය. එය දළදා මාලිගය ඉදිරිපස සිට ශ්‍රී විභීෂු දේවාලය දක්වා පැතිර තිබී ඇත. අඳවන් එම අගල දැකිය හැක.

මඟුල් මඩුව

රජ මාලිගය අසළම පසුපසින් මඟුල් මඩුව පිහිටා ඇත. රජුට රාජකීය අමුත්තන් හමුවීම සඳහා මඟුල් මඩුව සුදිමේෂි ස්ථානයක් විය. එහි හිර හතක් පසුකර ගිය තැන රජුගේ ආසනය තිබී ඇති අතර, අඳවන් එම ස්ථානයේ බිම හතරැස් කොටුවක් ලෙස ඉතිරිව තිබේ.

1857 වැලගලන්නයේ හත්වන එඩිවඩ් රජුගේ ලංකාගමනය නිසා මහනුවර නගරයේ වෙනස්කම් රැසක් සිදුකර ඇත. එහිදී මඟුල් මඩුවද වෙනස් කිරීමට පියවර ගෙන ඇත්තේ රාජකීය උත්සවයට සුදුනමක් වශයෙනි. එහි පැවති දිග වැඩිකර කණු ප්‍රමාණයද 16ත් වැඩිකර තිබේ. මඟුල් මඩුවේ පෙර පැවති කණු ගණන 48කි. සුදු පාළකයන් විසින් එයට එකතු කළ කණු හතර නිසා එය 64 දක්වා වැඩි විය. සුදු පාළකයන් ඉදිකළ කොටසේ බිම, පෙර පැවැති ගොඩනැගිලිල්ල බිමට වඩා පහළින් සිංහලීකයන් සකස් කර තිබේ.

ඒ අතර පරිශ්‍රය තුළ තිබූ වෙනත් රාජකීය ගොඩනැගිලි කඩා විනාශ කරන්නට ඇතැයිද විශ්වාස කෙරේ. මඟුල් මඩුව දෙපස ශාන්ති මණ්ඩපය තිබී ඇත. එය රජුට ශාන්තිකර්ම කිරීමට යොදාගෙන ඇතැයි පැවසේ.

මහඩාසල

රජවාසල තුළ මහමැදුර වෙහෙත් මහවාසල විය. එහි සැතපෙන කුටි, බිසෝ කුටි, සළු මණ්ඩපය මෙන්ම අමුත්තන්ගේ කුටි ආදියද විය. ඇතැමුන් පවසන්නේ රජතුමා මහවාසලේ නොසිට ආරක්ෂාව වෙනුවෙන් වෙනත් කිසිවෙකු නොදන්නා ස්ථානයකිහී රාත්‍රී කාලය ගත කළ බවකි.

රජ මාලිග ගොඩනැගිලිල්ල මහනුවර යුගයේ රාජ මාලිගයක සිව්භාවය හඳුනා ගැනීමට අඳවන් ඉතිරිව පවතින ගොඩම සාක්ෂියක් ලෙස විද්වත්තු දක්වති.

වායු උත්පාදන කම්පනය

රජුගේ මුළුතැන්ගෙය තුළ පිසින ආහාර අනුභවයේදී රජුට සිසිල් පවන් සැළීම සඳහා සකස් කරගත් වායු උත්පාදන ක්‍රමයක මතකයක් අඳවන් මහනුවර රාජසිංහ මාලිගයේ දැකිය හැකිය. එය අඩි 21ක් පමණ දිග පරාලයකට සවි කළ, ඉතා ඝනකම් රෙද්දකින් අගල් 10ක් පමණ වන සේ පහලින් රැඳී පවතක් අළුණන ලද අඩි 4ක් පමණ උස තිරයක් වැනි නිමාවකි.

එහි දෙපැත්තේ ඉහළ සිට බිම දක්වා ලණු දෙකක් සවිකර ඇත. එය දෙපසට සෙලවිය හැකි ආකාරයෙන් සකස් කර තිබේ. මෙහා පැත්තේ සිටින දෙදෙනා වේගයෙන් එය මේ පැත්තටත්, එහා පැත්තේ සිටින දෙදෙනා එහා පැත්තටත් සෙළවීමෙන් එයින් ඇතිවන සුළඟ රජුගේ දාහය නිවා දමමින් සිසිලස ලබා දී ඇත.



වේදී ඩු මහනුවර රජ මාලිගය- එදා

ශ්‍රී වික්‍රම සහ බිසෝවරු

ඉන්දියානු කුමාරියක් සංගමපාවා ගැනීමේ ක්‍රමය රෙට රජ පෙළපත් තුළ දෙවන රාජසිංහ රජුගෙන් ආරම්භ විය. එය බ්‍රිතාන්‍ය ජාතිකයන් රෙට යටත් කරගන්නා තුරු ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා පැවති ක්‍රමයකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසෝවරන්ත් අතර වෙන්කත රෙංගමල් අබයිසව වූවාය.

එතිසා රජු රෙ මාලිග පරිශ්‍රයේ තනර නි සිටියේය. බිසෝවරුන්ට වෙනම මාලිගා වෙන් විය. අගබිසව වෙනුවෙන් මැදුවාසල වෙන්කර ඇත. එය වඩාත් උස් නොවූ සහ මැදමිදුලකින් යුතු සෙරුකි. එතුළ බිසවට කැසිකිලි කටයුතු සඳහා පැවැති පහසුකම් අඳවන් දැකිය හැක.

රජුටත් නොඅැරෙන බිසවගේ මාලිගය

මෙහි මැදවාසලේ දොරටුව පිරකින් අතුල් දැමිය නොහැකිය. එහි අතුළුකින් පමණක් අඟල් දැමිය හැකි දොරකි. අතුළුත සිටින අයගෙ කැමැත්ත අනෙත් පමණක් පිටත සිටින අයට එම දොර විවෘත වෙයි.

රජතුමාට වුවද දොර විවෘත නොකර සිටීමට බිසවට තිබූ අයිතිය එයින් පහපුරු වෙයි. රජුට අකමිසව හමුවීමට යායුතු තම එයට පෙර මිනු විසින් මාලිගාවේ සේවිකාවක අත පළතුරු පිරවූ දැසකිනුත් වටිටියක් යැවිය යුතුය. බිසව එය භාරගන්නේ තම රජුට එහි යා හැකිය. එදින බිසවට යම් කාර්ය හෝ වෙනත් අපහසුතාවක් ඇතොත් එය ප්‍රතික්ෂේප කළේ නම් රජුට වුවද බිසව හමුවීමට යා නොහැකිය. තවද එම ප්‍රදේශයට වෙනත් කිසිවෙකු අතුළුත් වීමද දඩුවම් ලැබිය යුතු වරදකි.

රාජකීය අන්තඃපුරය

දළදා මාලිගය පසුපසින් පිහිටි පල්ලේවාසල රජුගේ අන්තඃපුර බිසෝවරන්ට වෙන් විය. එය මැදවාසලට අයත් පසින් අන්තඃපුර පිහිටා ඇත. එහි දැනට ජාතික කෞතුකාගාරය පවත්වාගෙන යයි. අසතුමුන් පවසන්නේ එදා රජු හමුවීමට පැමිණෙන අමුත්තන්ට මෙම පල්ලේවාසල වෙන්වූ බවයි. එය මැදමිදුල් දෙකකින් යුතු විශාල මැදෙයි. එහි තිබූ දැව කණු වෙනුවට ගඩොල් කණු යොදා ඒවා මඟුල් මඩුවේ ප්‍රතිසංස්කරණයේදී හාත්පසට ගත් බිවල් පවසයි.

මෙම ගොඩනැගිලිවල මහල් දෙවියන් සහ දැව කැටයම් යොදා කුඩා ප්‍රමාණයට සකස් කළ ඒවා විමසිලිමත්වීමට ලක්වේ.

රජුට අවතැන නොවන අන්තඃපුර කාන්තාවන් නුවර වැව මැද ඇති දූපතේ සිරකර තැබී යැයිද පැවසේ. එහෙත් රජ තමන්ට විරෝධ සුවයෙන් පසුවීමට මෙම දූපත ඉදිකළ බව ඩොයිලි දක්වයි. එය ජායතිලක මණ්ඩපය යනිත් හඳුන්වෙයි.

රන්දෝලි සහ රිදීදෝලි

අග්බිසව රන්දෝලියේ ගමන් කියාය. එතිසා අදය රන්දෝලිය වූවාය. දෙවන බිසවට තමන් සඳහා වෙන්කර තිබුණේ රිදී දෝලියයි. අදය රිදෝලිය වූවාය. නෙවැනි බිසව යකඩ දෝලියේ ගමන් කියාය. එතිසා අදය යකඩදෝලිය ලෙස ප්‍රචලිත වූවාය.

රජ පවුලේ සාමාජිකයෝ

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ බිසෝවරු සමඟ ඉන්දියාවෙන් පැමිණි ලෙබාව් කාන්තාවන්ට ලෙබාව් නිවස තවත්තෙක විය. ඔවුන් විසු පෙදෙස රජ දූවස කුරුස්සේ විදිය නම් විය. එහෙත් ඉංග්‍රීසි පාලකයන් සමයේ එම විදිය ලෙබාව් විදිය සහ නිවස ලෙබාව් නිවස නම් විය. හේතෙකලින්ව එය හිටපු මහ ඇමතිවරයාගේ නිල නිවස ලෙසද හැඳින විය.

රජ පවුලේ සාමාජිකයන්ට දිය නම වෙනුවෙන් උළුපැන්ගේ ඉදි විය. එයට විශේෂිය පාළකයන්ගේ අවශතෙන්ට යොදාගත් අතර, පසුකාලීනව එය සාංවර්ධනය කර තිබේ. එය රාජකීය පවුලේ අයට දිය නම සඳහා පමණක් වෙන් විය.

රාජකීයයන්ගේ ජලස්නානය

රජවරුන්ගේ ජලස්නානයට අවශ්‍ය පහසුකම් මාලිගය තුළ සම්පාදනය වී තිබුණි. එහෙත් පිටතට ගොස් එළිමහන් ස්ථානයක ජලස්නානය කළයුතු යැයි රාජකීය වෛද්‍යවරයා උපදෙස් දුන් විට රජ රජපිලිල්ලට ගොස් ජලස්නානය කළේය. අඳවන් රජපිලිල, නුවර, අම්පිටිය මාර්ගයේ නෙට දුරකදී දැකිය හැකිය.

රජුගේ වෙනත් මාලිගා

මහනුවර රජවරුන්ට ආරක්ෂාව සඳහා වෙනම මාලිගා පිටස්තර තැන්හි තිබුණි. එයක් කුණ්ඩසාලය. අනෙක හඟුරන්කෙතය. ඒවා ගඟින් මාලිගා ලෙසද ජනතාව දක්වති. ඒ අතර ආරක්ෂාව සඳහා වෙන් වූ මාලිගාවන් විය. හිල්ලම් එයකි. හඟුරන්කෙත මාලිගය සෙනරත් රජු විසින් ඉදිකළ එයකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පසුකාලෙක තමන්ට සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කර තිබේ. කුණ්ඩසාලේ රජ මාලිගාව 1804දී ජෙනරත්ත නමැති ඉංග්‍රීසි සෙන්පතියෙකු විසින් ගිනි තබා විනාශ කළේය. අද ඇතැන්ද හිස් භූමියකි. හිල්ලම් මාලිගය තිබූ තැන නවබුන් ඉතිරිව තිබුණද හිල්ලම් ගල විදැබලගාරය සමඟ ජනතාවගෙන් දුරස් විය.

කෙසේ හෝ මෙසේ කිනම මාලිගයකට හියද රජතුමාගේ ආරක්ෂාව වෙනුවෙන් මාලිගා තැන තැන ඉදිව තිබුණ, නමුත් මාලිගා යනුවෙන්ද අැතැඹිලු මෙවා හඳුන්වති. රජු ගත කරන්නේ කිනම මාලිගාවදිද යන්න සිසිවකු දැනසිටියේ නැත. අඳුම නරමින් දෝලාව ඔසවාගෙන යන අය පවා රජු සිටින්නේ කිනම් දෝලාවකදැයි නොදැති. එතිසාම රජු තනර වන්නේ කිනම් මාලිගයේ දැයි ඔවුන්ට නොදැනෙන සේ ආරක්ෂක කටයුතු සැලිධානය විය.

මුලදෑනි මණ්ඩපය

රජතුමා හමුවීමට අමුත්තෝ තිතර පැමිණෙති. සැමිණෙන නිලධාරීන් වෙනුවෙන් මූලාදෑනි මණ්ඩපය ඉදිකර තිබුණි. එතිදී ඔවුන්ට මුහුණ සෝදා පිරිසුදු වීමට දිය පොකුණක් එය ඉදිරිපිට සකස්කර තිබුණි. රජු හමුවීමට පැමිණෙන අමුත්තන්ට දින කිහිපයක් රජුගෙන් කැඳවීමක් ලැබෙතුරු රැඳී සිටීමට සිදුව තිබේ. එවැනි අවස්ථා සඳහාද මෙම මණ්ඩපය භාවිත කර ඇත.

මෙම ගොඩනැගිල්ල සිංහලීන්, තුණුවැඩ බදාමයෙන් තිමවන ලද බොරුම් වේදිකාවක් මත ඉදිකර ඇත. එහි මඟුල් මඩුවේ මෙන් දැව කණු 24කි.

එළා එනයක තිබූ පොකුණ අද එහි නැත. දශවාට වන සියවසේ මහා බ්‍රිතාන්‍යයේ ආදිපාදවරයා ලංකාවට පැමිණි සිහිනත් කරමින් ලංකාවේ කෝපි වගාවේ නිරත වැවිලිකරුවන් විසින් එහි වතුර ලඟක් සහිත සිමාවකුත් සකස් කළ අතර, අඳවත් එය පවති.

රාජකීය ගබඩා

උඩ ගබඩාව, අරමුදල් ගබඩාවද ඒ පරිශ්‍රයේ විය. රජුගේ ආයුධ රත් ආයුධ මණ්ඩපයේ තැන්පත් කර තිබුණි. මුද්දර මණ්ඩපය රාජකීය මුද්‍රා ආදිය වෙනුවෙනි. වෙන්දිසිරියන්ත ගායනා සඳහා යොදාගත් කවිකාර මඩුව අඳවන් ඉතිරිව ඇත.

දුක කියන ගණ්ඩාරය

තම ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් සාධාරණය ඉටු නොවූ තැන ජනතාවට රජු වෙත තම දුක්ගැනවිලි කීමට තාර දෝමාලය සෙළුවට බිමේ ඝණ්ඩාරයක් විය. එළාට රජුගෙන් පසු එවැන්නක් ගැන සඳහන් වන්නේ මහනුවරදී පමණක් යැයි ඉතිහාසඥයෝ පවසති. එය යුක්තිය පසිඳලීම වෙනුවෙන් ජනතාවට නාද කළ හැකි එකකි.

නිලමේ වලව්

නිලමේවරුන්ගේ වලව් මාලිග පරිශ්‍රයට සම්පව පිහිටා තිබුණි. ඒ අතර යටිනුවර විදියේ දෙල්ගොම වලව්ව අද වෙළඳ ස්ථානයකි. අසහලේපොළ වලව්ව මහනුවර රිමාණ්ඩ බන්ධනාගාරයකි. පිදිමහලාව් වලව්ව ජනධිපති මන්ද්‍රියයි. දුනුවිල වලව්වේ මහනුවර මහ නගර සභාව පැවැත්වෙයි.

රජු අත්අඩංගුවට පත්වීම

දුම්බර මැද මහනුවර බෝමුරුව් මැදයාය උඩුපිටිය ආරච්චිලාගේ හිමියෙ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සාගස සිටියදී සුදු හමුලාව දැක බියට පත් ළමයෙකුගේ මගපෙන්වීම නිසා රජ පවුල බ්‍රිතාන්‍යයන්ගේ අත්අඩංගුවට පත්විය.

"රජු අත්අඩංගුවට ගත් පසු සිංහල ජනතාව මඟුන්ට හිරිහැර කර තිබෙනවා. කෑගේ තිබූ අරැඹගලය සවා කඩාගෙන එයින් ගල් ගලා තිබෙනවා. රජුගේ රසඥතාව මහනුවර වැව ඉදිකිරීමෙන් දැකිය හැකිය. විවේක සුවය සඳහා ජයතිලක මණ්ඩපය ඉදිවිය.," බ්‍රිතාන්‍ය පාළකයන් වරින් වර එසේ සටහන් යොදා ඇත.

අරැඹගලය කඩා ගැනීම නිසා තුවාල වූ කණෙන් ගැලූ ගල් සහිත හැට්ටිය අඳවන් කොළඹ ජාතික කෞතුකාගාරයේ දැකිය හැකිය.

එසේම 1811 ජනවාරි 25වැනි දින ඩොයිලිගේ දිනපොතේ සටහනකට අනුව මහනුවර රජ මාලිගයේ යම් භූත දෝෂයක් ගේතුවෙන් හිතක් පමණ දෙනා මිය ගොස් ඇති බව දක්වයි. මෙම යක්ෂ දෝෂයෙන් බේරීම සඳහා රජු කුණ්ඩසාලේ මාලිගයට ගොස් ඇතැයිද පවසයි. රජුට කුඩා දියණියක්ද සිටියාය. එම දියණියත්, තිරුඅම්මාත් එම දෝෂයෙන් මිය ගොස් ඇති බවද ඩොයිලි දක්වයි. ඩොයිලිට අනුගේ මිත්තුකරුවන් වූ සටහන් ඇත්තේ රජ මාලිගයේ දොරටු තිහර ඇරෙන විසඳුන බවයි.

රජකම් කළත් කළකම් පල දීම

රජුගේ සිරුරට එක තැබිය හැකි පුද්ගලයන් තිදෙනෙකි. ඒ, අත්පා දෝවනයට ජලය සපයන

මැණිවර නාන්කාමරයේ කණපැර - මහනුවර ජාතික කෞතුකාගාරය

ශ්‍රී වික්‍රම රාජසිංහ මඟුන්ගේ නානකිය - මහනුවර ජාතික කෞතුකාගාරය

දියවඩන නිලමේ, රජුට සැළිවිදි ඇත්දිවම හාවල සිටි සළුවඩන නිලමේ සහ රාජකීය වෛද්‍යවරුයාය. එහෙත් රජු ඉංග්‍රීසින්ට යටවූවූ පසු මිනු ඇඳලා ගැනීමට උදව් කළ මුළඳැදුන්ති, "මම උඹා වැළඳපරකින් ගැට ගසාපියවි" යනුවන් තියෝන දෙන තරමට රජු හැඳුළුවි ඇතැයි පැවසේ. 'රජකම කළත් කළකම් පල දෙනේ' එසේ යැයි උඩරට ජනතාව අතර කතාවක් ඇත.

ඉංග්‍රීසීන් රජු මත්පැනට පුරුදු කර ඇතැයිද සඳහන් වේ. රජු පවසා ඇත්තේ "පරස්සම් වෙන්න. අහසලේපොළ සහ මොළුවිතොඩෙනේ පරස්සම් වෙන්න. මවුන් මා රැවටුවා." යනුවෙන් යැයි දොස්තර ගෙත්ර් මාඤ් දක්වා ඇත.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසාන කාලය

අත්අඩංගුවට පත් රාජසිංහ රජු තම බිරින්දෑවරු හතරදෙනා සහ මවගේ අත්තගෙ ඩොයිලි වෙත දිකුරට මවුන්ව කිසිදු කරදරයකින් තොරව රැකගන්නා ලෙස ඉල්ලා සිව් වන 1815 පෙබරවාරි 22 දින ඩොයිලි තම දිවතපොත්හි සටහන් කර ඇත.

අත්අඩංගුවට පත් රජු කොන්වොලිස් තැවෙන් ඉන්දියාව හරහා ගෝවට ගෙන යාමට කටයුතු සම්පාදනය විය.

1816 ජනවාරි 26වන දින සවස 6.00 ආසන්න වෙන්ම රාජකීය කොන්වොලිස් නෞකාව නුවර කොළඹින් පිටත් විය. රජතුමා මෙම බිසෝවරුද, අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් සැරසී සිටියෝය.

"රජ කරන්නට මට අවස්ථ නැති හන්දා මේ ලැබෙන සැළකිලිවලට ස්තූති කළ යුතුයි." යනුවෙන් තමන් හොඳකැමැත්තෙන් හැරදී ඒමුදැළ පළසක් සහිත ආසනය මත අසුන්ගත් රජු පවසා ඇත. මෙරට රාජවංශය එසේ අවසන් විය.

ශ්‍රී වික්‍රම රාජසිංහයන්ගේ අවසාන මොහොත

වෙල්ලොව් කොටුවේ අඳුරුදු 16ක් පිවත්වූ රජු අඳුරුදු 52ක් ආයු විඳ 1832 ජනවාරි 30වන දින උදරාබාධයකින් මිය ගියේය.

"ජනවාරි 30වන දින සවස වන විට සිහිමුර්ජාව සිටි මහනුවර රජතුමා එදින සවස 3.00ට පමණ මිය ගියේය. පසුව පවුලේ ගැබිනියන් සහ්තේක මත පසු දින ඉර අඳරට යාමට පෙර ඔහුගේ අවසන් කටයුතු සිදුකළ බව සැනට් ජෝර්ජ් බඳකොටුවේ සෙන්පති විසින් ආණ්ඩුවේ මහළුකම් හෙත්ර් වැසියර් වෙත ජනවාරි 31 දින යැවූ ලිපියකින් දක්වා ඇත.

රාජසිංහ රජු අත්අඩංගුවට පත් ස්ථානය සිහිවනු පිණිස, 1906දී රොබට්ර් ව්ඨර්ස් ආණ්ඩුකාරයා විසින් මහනුවර, මහියංගණය පාරේ පොළොවත්ත මාර්ගයේ සිමාවකයක් පිහිටුවන ලදී.

මඟුල් මඩුවේ රජුගේ ආසනය තිබූ තැන - මේ ගල් නොමැති තත්වයේ තෙවුවට

මුළුදෑනි මණ්ඩපය